26 වන පිටෙන්

විසින් තනවන ලද මාර්ගවල ආයු කාලය මාස හත අටකට වඩා අඩු වුවද ඒ පිළිබඳව කිසිදු ප්‍රශ්නයක් ඇති නොවූයේ ඇමැතිවරයා ඇතුළු බලධාරීන් ඔහුගේ අතේ නැටවෙන රූකඩ බවට පත්ව සිටි නිසා ය.

ග්‍රාමීය මාර්ග සිය ගණනක් තනවා යහමින් මුදල් උපයා ගත් මාර්ගඵලලාභියාට රටේ මුල් පෙළේ මාර්ගවලට ද අත ගැසීමේ වුවමනාව ඇති විය. 'මම මෙපමණ කාලයක් කළේ මොනවද? සල්ලි හම්බ කරනව නම් මෙන්න වැඩ.' අනිවාර්යයෙන් ම මාර්ගඵලලාභියාට එසේ සිතෙන්නට ඇත. ඔහු සමඟ තරග කළ මුල් පෙළේ කොන්ත්‍රාත්කරුවන් දෙදෙනකු පරලොව යැවීමට මාර්ගඵලලාභියා පසුබට වූයේ නැත. කෝටි දෙසීයක මාර්ග කොන්ත්‍රාත් වැඩකට අත ගැසූ මාර්ගඵලලාභියාගේ ඉලක්කය වූයේ කෝටි සියයක ලාභයක් ලබා ගැනීමය. නියමිත කාලයට පෙර මාර්ගය ඉදිකර බාරදීම මාර්ගඵලලාභියාට හැකි වූ අතර මේ නිසාම ඔහුට බොහෝ අයගෙන් කීර්ති ප්‍රශංසා ගලා එන්නට විය.' 'දැනටමත් ඔබ අති දක්ෂ කාර්යශූර කොන්ත්‍රාත්කාරයෙක් වෙලා ඉවරයි. ඇමැතිවරයා එසේ කීවේ මාර්ගය විවෘත කිරීමේ උත්සවය තිබුණ දින සන්ධ්‍යාවේ පැවැති උණුසුම් ප්‍රිය සම්භාෂණයේදී ය.

මාස අටකට පසු මෙකී මාර්ගය ගිලා බසින්නට පටන් ගත්තේය. ලිවීමට කිසිවක් නොමැතිව සිටි මාධ්‍යකරුවෝ කඩි ගුලක් සේ ඇවිස්සුනහ. යෝධ කැමරා කර උඩ සවිකරගත් ඔවුන් තුන්කුද ගැසී ගත් ඡායාරූප පුවත්පත් පිටු ගණන් වසා දැම්මේය. පාර්ලිමේන්තු ඇත්තෝ ද මේ සම්බන්ධයෙන් දින කිහිපයක්ම කෝලාහල කළේය. ප්‍රශ්න විසඳීමෙහි උපන් හපන්කම් ඇති බලධාරීන් විසින් මේ හා සම්බන්ධව සොයා බලා වාර්තාවක් ඉදිරිපත් කිරීමට මහ මොළකාරයන් කීපදෙනකුගෙන් සමන්විත කොමිසමක් පත් කළේය. (කොමිසන් පත් කිරීම හා ඒ හා සම්බන්ධ වාර්තා හමස් පෙට්ටිවල ද තැබීම බොහෝ කාලයක සිට පැවත ආ විලාසිතාවකි.) පැය විසිහතරක් යන්නට මත්තෙන් කොමිසම රැස්විය. 'මහජන මුදල් මේ විදියට කාබාසිනියා කරන්න ඉඩ දෙන්න එපා.' ඔවුන් සැවොම එක හඬින් කියා සිටියහ. මාර්ගඵලලාභියා ද සම්බන්ධ කරගත් කොමිසමේ සාමාජිකයෝ අදාළ මාර්ගය නිරීක්ෂණයට ගියහ. කොමිසමේ නායකයා ආයාචනාත්මක දැසින් තමා දෙස ඇසිපිය නොහෙලා බලා සිටිනු මාර්ගඵලලාභියා දුටුවේය.

'ඉඳපන් ගිලෙන පාරෙදිම උඹත් ගිල ගන්නම්කො' මාර්ගඵලලාභියා තමාටම කියා ගත්තේය. කණ්ඩායම් නායකයා කණ්ඩායමෙන් තනි වූයේ ඔහුගේම වුවමනාවටය. මාර්ගයට අදාළ ලිපිගොනුව ගැනීමට මෙන් කණ්ඩායම් නායකයා ඔහු අත තිබූ බ්‍රීෆ්කේස් එක විවෘත කළේ මාර්ගඵලලාභියා ඉදිරිපිටදී ය.

අවශ්‍යතාව කුමක්දැයි තෝරා බේරා ගැනීමට උපන් හපන්කම් ඇති මාර්ගඵලලාභියා ඔහු ළඟ සඟවා ගෙන සිටි මුදල් කවරය බ්‍රීෆ්කේස් එකට දැම්මේය. කණ්ඩායම් නායකයා කෘතඥතා පූර්වක වූ බැල්මක් මාර්ගඵලලාභියා වෙතට යොමු කිරීමටත් පෙර පපුව දැතින් බදාගත් මාර්ගඵලලාභියා බිම ඇද වැටුණේය. කණ්ඩායම් නායකයා දෙවන වර ඇසිපිය ගැසීමටත් පෙර මාර්ගඵලලාභියා මියගොස් සිටියේය. මළකඳ දෙස මොහොතක් බලා සිටි කණ්ඩායම් නායකයා බ්‍රීෆ්කේස් එක ඒ මේ අතට පද්දා හැරියේ මහත් උඩඟුකමිනි. තත්පරයක්වත් පමා නොවූ කර්මඵලශක්තිය මාර්ගඵලලාභියා අපායට ඇදගෙන ගියේය. නර ලොවේදී වැඩ ඉෂ්ඨ සිද්ධ කර ගත් ආකාරයටම යම ලොවට ද මුහුණ දිය යුතු යෑයි මාර්ගඵලලාභියා තරයේ සිතා ගත්තේය. යම රජු රවටා හෝ බිය වද්දා මෙයින් චුත විය යුතු ය. එයින් කොටසක් දැනටමත් සාර්ථකව නිමා වී ඇත. යමරජු හොඳටම බිය වී ඇත. ඔහුට කර කියා ගැනීමට කිසිම දෙයක් නැති සේය. යම රජු දෙස රවා බැලූ මාර්ගඵල ලාභියා දකුණු පාදය ඉස්සුවේ යම රජුට පා පහරක් දීමටය. ,ඉක්මන් වෙන්නෙ මොකටද?, බැරිම වෙන්න ගියොත් එහෙම කරනවා, මඳක් කල්පනා කළ මාර්ගඵලලාභියා පාදය බිම තබා ගත්තේය.

ක්ෂණිකව තම හදවත තුළට පැමිණි තිගැස්ම තුනීවන තෙක් සිටි යම රජු හිත සන්සුන් කර ගන්නට පටන් ගත්තේය. ඇයි මම මේ තරමට කලබල වුණේ. අපායට ආපු පළමුවන මිනිහ නොවෙයිනෙ මේ. අපායට ආපු හැම ජගතෙක්ම මම දැක්ක හැටියෙ භයෙන් හිරාන්ත වෙලා මගේ පය පාමුල වැඳ වැටෙනව. නායකවරු, ඇමැතිවරු, නොයෙක් තරාතිරමෙ බලවත්තු, ඔය මොන කෙළි කාරය ආවත් මගේ ළඟට එන්නෙ හතර ගාතෙන්. ඒත් මේ මිනිහ නම් බොහොම ගාම්භීර විදියට ඇවිල්ල මෙතන කෝලහල කරන්න පටන් ගත්ත. එතකොට මොන රජාද කලබල නොවී ඉන්නෙ.

වැරදිලාවත් මාර්ගඵල ලාභියෙකුට දඬුවම් නියම කළා නම් මමත් කපෝතියි. ඒ කොහොම වුණත් කමක් නැහැ මම මේ මිනිහ ගැන පොඩි පරීක්ෂණයක් කරන්න ඕන.' යම රජු සන්සුන් සිතින් තීරණයකට ආවේය. මාර්ගඵලලාභීන් පිළිබඳව පුළුල් පරීක්ෂණයක් කිරීමට තමා සතු දැනුම ප්‍රමාණවත් නොවන බව යම රජුට වැටහිණි. නර ලොවේදී කොතරම් පාප ක්‍රියා කළ ද ධර්ම ඥානයෙන් අගතැන්පත් වූද, දැනට දෙව්දත් තෙරනුවන් දැවී දැවී උඩ මතුවෙමින් යට ගිලෙමින් වද වේදනා විඳින ලෝදිය කටාරමට දකුණු අත පැත්තේ ඇති ලෝ දිය කටාරමෙහි ඒ අයුරින්ම වද වේදනා විඳින හිමිනම රැගෙන එන ලෙස යමරජු යම පල්ලන්ට නියෝග කළේය.

නිසැකවම හිමිනම සිටින ලෝදිය කටාරම සහ සුද්දෙන්ම විනිශ්චය කර ගැනීමට යමපල්ලන්ට අපහසු විය. ඒ අපාගත වී සිටින හිමිවරුන් විශාල පිරිසක් සිටින බැවිනුයි. විවිධ තර්ක ඉදිරිපත් කළ යමපල්ලෝ අදාළ හිමිනම සිටින්නේ කුමන ලෝදිය කටාරමෙහිද යන්න පිළිබඳව තීරණයකට ආහ. යමපල්ලෝ නියමිත ලෝදිය කටාරම වටකර ගත්හ. ඒ අවස්ථාවේ හිමිනම කටාරමෙහි ගිලී ගොසිනි. මොහොතකින් දැත් උඩට උස්සා ගත් හිමිනම ලෝදිය කටාරමෙන් මතු විය. හිමිනමගේ දැතින් අල්ලා ගැනීමට යම පල්ලෝ සමත් වූහ. ලෝදියෙන් තැම්බී ගිය හිමිනමගේ දැතේ උඩුහම දිරාගිය ෂර්ට් අතක් මෙන් ගැල වී ආවේය. අපායට පැමිණ තවමත් දෙසතියක්වත් ගත වී නොමැති බැවින් හිමිනමගේ සිරුරෙහි බර කළඳකුදු අඩු වී නොතිබිණි. යම පල්ලෝ හිමිනම ගොඩට ඇද ගත්තේ මහත් ආයාසයෙනි. ලෝදියෙන් තැම්බුන සිරුරෙහි උඩුහම සම්පූර්ණයෙන් ම වාගේ ඉවත්ව තිබිණි. එය පුළුස්සා දමන ලද ඌරකුගේ සිරුරක් මෙන් විය. යමපල්ලෝ මහත් ආයාසයෙන් හිමිනම තම යම රජු දෙසට වාරු කර ගෙන ගියහ.

තමා ආසන්නයට හිමිනම ගෙන ආපසු යම රජු ඉදිරියට ගොස් නමස්කාරය කළේය. හිමිනමගේ පිළිස්සී ගිය දැසෙහි තිබුණ අඩ පෙනුම මෙය දුටුවේය. යම රජු ගෞරවාන්විතව මාව පිළිගත්හ. මොකක් හරි පොට්ට චාන්ස් එකක් වත්ද දන්නෙ නැහැ, අධික වේදනාවෙන් පෙළුන හිමිනමට නව ජීවයක් පැමිණියේය. හිමි නම ද මඳ සිනහවක් කට කොනකට ගැනීමට උත්සාහ කළේය. එහෙත් නොපැමිණියේය. හිමිනම වට පිට බැලුවේය. යම රජු ඉදිරියේ අභිමානවත් ලෙස සිටගෙන සිටින පුද්ගලයා කවරෙක් දැයි හිමිනම හඳුනා ගත්තේය. 'එහෙනම් මූත් මෙතනට ඇවිත්. මේකාත් හවුල් කරගෙන. මම කොපමණ පාපී වැඩ කරල තියෙනවද? හිමිනමගේ හිස කිරි ගැසී ගියේය. ධාතු මන්දිරයේ තිබූ රත්‍ර බුදු පිළිමය හා රං කරඬුව මතකයට ආ හිමියන්ට හිස මහපොළොවේ ගසා ගන්නට සිතිනි. හිමිනමට මාර්ගඵලලාභියා පිළිබඳව දැඩි වෛරයක් ඇති විය. හදිසියේ ලලිතා මතකයට ආ බැවින් ඒ වෛරය සෙනෙහසක් බවට පත්විය. එහෙත් මාර්ගඵල ලාභියාට නම් කිසිසේත් හිමිනම හඳුනාගැනීමට නොහැකි විය. ඒ හිමිනම දැඩි දඬුවම් වලට ලක් වී සම්පූර්ණයෙන් ම වාගේ වෙනස් වී සිටි බැවිනි.

'හිමියනි' මා මේ අවස්ථාවේ ඔබ වහන්සේ කැඳෙව්වේ අවශ්‍ය කරන දහම් කරුණු කීපයක් දැන ගැනීමටයි. මා වෙත අනුකම්පා කොට එම දහම් කරුණු පැහැදිලි කර දෙන සේක්වා, යමරජු නැවත වාරයක් හිමිනමට නමස්කාරය කළේය.

'මහරජ ඔබතුමාට වටහා ගැනීමට අවශ්‍ය දහම් කරුණු මොනවාද?' ශරීරයෙන් පැමිණි සියලුම වේදනාවන් තුනී කර හැරී හිමිනම යම රජුගෙන් විමසීය.

'හිමියනි' මට දැන ගැනීමට අවශ්‍යව ඇත්තේ මාර්ගඵල යනු කුමක්ද? මාර්ගඵල ලාභියා යනු කවරෙක්ද?
යන ප්‍රශ්න දෙකයි. යම රජු, හිමියන් දෙස බලාපොරොත්තු මිශ්‍රිත බැල්මක් හෙළුවේය.
'මහරජ ඔබට පේන්නෙ නැද්ද මම ඇඳගෙන ඉන්නෙ මොනවද කියලා. යන්තම් වහගෙන ඉන්නව විතරයි. පළමු කොට මට සිවුරු පිරිකර ලැබිය යුතුයි. වට අත්තක් ලැබිය යුතුයි. හිඳ ගැනීමට සුදුසු අසුනක් තිබිය යුතුයි. දවුල් හේවිසි පෙරටු කර ගත්තා වූද, උඩට උඩුවියන්, පයට පාවඩවලින් පරිපූර්ණ වූ පෙරහැරකින් මා වඩමවාගෙන ආ යුතුයි. මාගේ පා දෝවනය කළ යුතුයි. ධර්ම දේශනය අවසානයේ සුදුසු පිරිකරක් පූජා කළ යුතු අතර එම පිරිකර අතරට තබා මුදල් පිරවූ කවරයක් තිබිය යුතුමයි. මෙකී වත් පිළිවෙත් පිළියෙල කරන්න. මම ඔබට දහම් කරුණු පහදා දෙන්නම්, දැඩි පිපාසයක් දැනුන බැවින් හිමිනම තොලකට ලෙවකෑවේය.
යම රජුට ඌරු ජුවල් ආවේය. පෙනේද පව් කරල කරල අපාගත වෙච්ච මුගේ පම්පෝරිය. ලැජ්ජා නැතිව මුදල් පුරවපු කවරෙකුත් ඉල්ලනව.' යමක් මතක් වූ විලස යම රජු කේන්තිය සඟවා ගත්තේය.

'මහරජ මම ඉන්නෙ ඉතාම අමාරුවෙන්. ඒ නිසා හිඳ ගැනීමට අසුනක්වත් පිළියෙල කරන්න. හිමිනමගේ ඒ ඉල්ලීමත් සමඟ යම රජු තුළ සැඟවී තිබූ කෝපය පිටතට පැන්නේය. 'වහාම මගේ ප්‍රශ්නයට උත්තර දෙව. මේක යම ලෝකය. මම යම රජු' යම රජු අඩි පොළොවේ හැප්පුවේය.

තමාගේ කිසිදු ඉල්ලීමකට යම රජු කන් නොදෙන බව සිතාගත් හිමිනම මොහු තවදුරටත් කේන්ති ගැස්වීමෙන් තමාගේ දඬුවම් වැඩි විය හැකි යෑයි සිතා ගත්තේය. 'එසේ නම් මහරජ මා ඉතාම කෙටියෙන් අවශ්‍ය දහම් කරුණු පහදා දෙමියි' ප්‍රකාශ කළේය.

ගොඩක් රජවරු වගේ මේ රජත් දන්න මලහත්තිලව්වක්වත් නැහැ. දන්න එකම දේ මිනිස්සුන්ට වද දෙන එක විතරයි. මාර්ගඵල හතරෙ නම් කියල වැඩේ නවත්තන්න ඕන' හිමිනම තමාටම කියා ගත්තේය.

"මහරජ මාර්ගඵල හතරකි. ඒ සෝවාන්, සකෘදාගාමී, අනාගාමී අර්හත්, යන්නයි. හිමිනමට කීමට හැකි වූයේ එපමණකි. මෙතෙක් වේලා යම රජු දෙස ඔරවා බලාගෙන සිටි මාර්ගඵලලාභියා කොක්හඬලා සිනා සෙන්නට වන්නේය. 'ඇයි ඔබ ඔය විදියට සිනාසෙන්නෙ' යම රජු විමසීය.

'යකෝ මේ උන්නාන්සෙ කියන්නෙ මාර්ගඵල හතරක් කියලනේ. ඒක එහෙම වෙන්නෙ කොහොමද? මම නර ලොවේදී මාර්ගඵල සිය ගණනක් ලබාගෙනම තියෙනවා. අන්තිමට මට ආපු මාර්ගඵලය තමයි කෝටි සීයක් සාක්කුවට දමා ගත්තු මාර්ගඵලය. ඉතින් යකෝ හිනා නොවී ඉන්න පුළුවන්ද?' මාර්ගඵලලාභියාගේ සිනහව නැවතුනේම නැත.

යම රජුට සියල්ල වැටහිණි. 'මූ මාර්ගඵල කියන්නේ පාරවල් හදන්න කොන්ත්‍රාත් අරගෙන සල්ලි ගරා ගන්න එකට. එහෙම එවුන් නම් කී දෙනෙක් මේකෙ ඉන්නවද? මූ නම් තියන්න වටින්නෙ නැහැ. නේ ඇත්තට මම මේක ඉදිරියේ මී පැටියෙක් වගේ බය වෙලා හිටිය තරමක්.' යම රජුට ඇති වූ හතර මර විලි ලජ්ජාව යම පල්ලන්ට ද දැනී ඔවුන්ගේ කට කොන්වල සිහින් සිනා මතු වී තිබිණි.

'යම පල්ලනි' මුගේ දිව පෙත්තෙන් පෙත්තට කපා ඉවත් කරනු. නිරයේ ඇති සියලුම දඬුවම් මේ තක්කඩියාට ලබා දෙනු. යම රජු යම පල්ලන්ට නියම කළේය. මාර්ගඵල ලාභියා කපා හෙළන ලද කටු ඉඹුල ගසක් මෙන් යම රජු ඉදිරියේ ඇද වැටුණේය.

